සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

හින්දු ශිෂ්ටාචාරය I
இந்து நாகரிகம் I
Hindu Civilization I

46 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) යොදා දක්වන්න.

1. ඍග් වේදයේ ජනතාවගේ විනය භාරව සිටින දෙවියන් වශයෙන් ප්‍රශංසා ලබන්නේ,
   (1) වරුණන් ය. (2) ආදිත්‍යන් ය. (3) රුද්‍රන් ය. (4) අග්නි ය. (5) සෝමන් ය.

2. පල්ලවයන්ගේ ශෛව ආගමික බැඳීම දැක්වෙන ආගමික ලාංඡනය වූයේ
   (1) ධර්මචක්‍රය ය. (2) නන්දි ය. (3) ස්වස්තිකය ය. (4) සිංහයා ය. (5) ගුරුළා ය.

3. සිවාගමම්වල දේවාල යාතුකර්ම පැහැදිලි කරන කොටස් හතර වන්නේ,
   (1) සිට්සයි, කල්පම්, සන්දස් හා නිරුක්තම් ය.
   (2) සරියයි, කිරියයි, යෝගම් හා ඥානම් ය.
   (3) කර්ෂණම්, ප්‍රදිෂ්ටයි, උට්සවම් හා ප්‍රායච්චිත්තම් ය.
   (4) ආසාර කාණ්ඩම්, වියවහාර කාණ්ඩම්, ප්‍රායච්චිත්ත කාණ්ඩම් හා උට්සවම් ය.
   (5) මූර්ති, තලම්, තීර්ත්තම් හා උට්සවම් ය.

4. වේදවලට කියැවෙන නම්වලින් 'සුරුදි' යන්නෙහි තේරුම,
   (1) ගායනා කිරීම ඇසීමෙන් ම පැවතුණකි. (2) අකුරෙන් නොලියනු ලැබූවකි.
   (3) මිනිසුන් විසින් බිහි නොකරන ලද්දකි. (4) ඍෂිවරුන් විසින් බිහි කරන ලද්දකි.
   (5) සූක්තම් මගින් බිහි කරන ලද්දකි.

5. 'දියට මිශ්‍ර කළ ලුණු නොපෙනෙන අයුරින් බ්‍රමම් නොපෙනී සැම තැන ම පිරී ඇත' යන වර්ණනාව සඳහන් වන උපනිෂද්,
   (1) කඨෝපනිෂද් ය. (2) සාන්දෝක්‍ය උපනිෂද් ය.
   (3) බ්‍රහදාරන්යක උපනිෂද් ය. (4) මුණ්ඩකෝපනිෂද් ය.
   (5) කේන උපනිෂද් ය.

6. ගුරුකුල අධ්‍යාපනය අවසානයේ ඇදුරුතුමා විසින් ගෝලයාට දේශනා කරන ලද විනයානුබද්ධ උපදෙස් අඩංගු උපනිෂද්,
   (1) ඊස උපනිෂද් ය. (2) තයිත්‍රිය උපනිෂද් ය.
   (3) මාහානාරායණ උපනිෂද් ය. (4) කෞෂීදගි උපනිෂද් ය.
   (5) අයිදරේය උපනිෂද් ය.

7. පල්ලව යුගයේ තමිල්නාඩුවේ වෛදික අධ්‍යාපනය ලබා දුන් ආයතනය,
   (1) නයිමිසාරණ්යම් ය. (2) තින්නයි පාසල ය.
   (3) කාංචි කඩිගයිතානම් ය. (4) ව්‍යාකරණ මණ්ඩපය ය.
   (5) රජමාළිගය ය.

8. "මල් කඩා පූජා කරනවාට වඩා පිරිසිදු හදවතින් කරන වන්දනාව වැදගත් ය" යනුවෙන් ප්‍රකාශ කළ ආගමික නායකයා,
   (1) සුවාමි විවේකානන්දර් ය. (2) සංකරර් ය.
   (3) තායුමානවර් උපනිෂද් ය. (4) මත්තුවර් ය.
   (5) කබීර්දාසර් ය.

9. 'අර්ථසාත්තිරම්' නම් ග්‍රන්ථයේ කර්තෘවරයා,
   (1) නාරදර් ය. (2) වාල්මිකී ය. (3) ව්‍යාසර් ය. (4) කෞටිල්‍ය ය. (5) වසිට්ටර් ය.

[ දෙවැනි පිටුව බලන්න.

10. කලාව සහ ආගම අතර පවතින සමීප සම්බන්ධතාව හින්දු කලා මූලධර්මයක් ලෙස ලෝකයට පැහැදිලි කළ අප රටේ කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයා
(1) කාසිවාසි සෙන්දිල්නාදයිර් ය. (2) කලායෝගි ආනන්ද කුමාරස්වාමි ය.
(3) ඥානප්‍රකාස සෑමිවරයා ය. (4) අරුණාසල තේසිගර් ය.
(5) ත. කයිලාසපිල්ලයි ය.

11. යජුර් වේදයේ විවිධ නාමවලින් වන්දනා කරන ක්‍රමය පැහැදිලි කරන, සදරුත්රියම් යන කොටස හා සම්බන්ධ දෙවියන්,
(1) සූර්යයා ය. (2) රුද්‍රන් ය. (3) උෂයි ය. (4) ඉන්ද්‍ර ය. (5) අග්නි ය.

12. ශ්‍රී ලංකාවේ ක්‍රි.ව. 1380 වර්ෂවල රචනා කරන ලද 'සෙගරාසසේගර මාලයි' යන ග්‍රන්ථයේ කර්තෘවරයා,
(1) පෝසරාස පණ්ඩිදර් ය. (2) සෝමසන්මා ය. (3) ඉඩයිකාඩර් ය.
(4) අම්බලවානපිල්ලයි ය. (5) සභාපති ජොයාතිෂර් ය.

13. හින්දු ආගමික මෙය්යියල් හි අත්වයිද සංකල්පයේ කියැවෙන ඔරුමයි වාදයේ ආරම්භය දැක්වෙන වේද ගීතය,
(1) බ්‍රහ්මචර්ය සූක්ත ය. (2) අග්නි සූක්ත ය. (3) නාසදීය සූක්ත ය.
(4) යම සූක්ත ය. (5) සුහර්ණා සූක්ත ය.

14. 'ආදිත්‍ය හෘදයම්' නම් ග්‍රන්ථය මගින් ප්‍රශංසා කරනු ලබන්නේ,
(1) බ්‍රහස්පති ය. (2) සෙනසුරු ය. (3) සූර්ය භගවාන් ය.
(4) ඉන්ද්‍ර ය. (5) වරුණ ය.

15. 'ධර්මය පවතින ස්ථානයේ ජයග්‍රහණය ද ඇත' යන ධර්මය පැහැදිලි කරන ග්‍රන්ථය,
(1) අර්ථ සාත්තිරම් ය. (2) සුක්‍රනීති ය. (3) භගවත් ගීතාව ය.
(4) කේන උපනිෂද් ය. (5) මානසාරම් ය.

16. මත්තුවර් විසින් භාෂ්‍ය ලියූ ප්‍රධාන ග්‍රන්ථවල නම් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) භගවත් ගීතාව, බ්‍රහ්ම පුරාණම්, කඨෝපනිෂද්
(2) බ්‍රහ්ම සූත්‍රය, භගවත් ගීතාව, දසෝපනිෂද්
(3) භගවත් ගීතාව, බ්‍රහ්ම සූත්‍රය, බ්‍රහ්ම පුරාණම්
(4) මාන්ඩූක්‍ය කාරිගයි, ශ්‍රී භාෂ්‍යම්, භගවත් ගීතාව
(5) බ්‍රහ්ම සූත්‍රය, කල්ප සූත්‍රය, බ්‍රහ්ම පුරාණම්

More Past Papers at
tamilguru.lk

17. කුමාර දෙවියන්ගේ වන්දනා ක්‍රමය ගැන කියැවෙන ග්‍රන්ථය,
(1) කුමාර සම්භවම් ය. (2) දසකුමාර සරිදම් ය. (3) හර්ෂ සරිදම් ය.
(4) කුමාර තන්තිරම් ය. (5) බෘහත්සම්හිතයි ය.

18. තිරුමාල් දෙවියන්ගේ පංච ස්වරූප සඳහන් කාණ්ඩය කුමක් ද?
(1) පරත්තුවම්, ව්‍යූගම්, විභවම්, අන්තර්යාමිත්තුවම්, අර්චයි
(2) තත්තුවම්, පේරු, තගුදි, උපායම්, පලන්
(3) මූර්ති, තලම්, තීර්තම්, තිරුපති, ශ්‍රීරංගම්
(4) පරත්තුවම්, ව්‍යූගම්, තිරුපති, ශ්‍රීරංගම්, විභවම්
(5) පරත්තුවම්, තිරුපති, ශ්‍රීරංගම්, තගුදි, පේරු

19. 'ප්‍රායෝගික වේදාන්තය වන්නේ ජනතාවට සේවය කර ඔවුන්ගේ දුක් තුරන් කිරීමයි' යන්න අනුගමනය කළ හින්දු පුනර්ජීවකයා,
(1) රාමානුජර් ය. (2) සංකරර් ය.
(3) ශ්‍රී රාමක්‍රිෂ්ණ පරමහම්සර් ය. (4) ගෞඩපාදර් ය.
(5) මත්තුවර් ය.

20. තිරුනෙල්වේලි ඥානප්‍රකාශ ස්වාමිහල් විරුත්තියුරයි ලියූ වැදගත් උපාගමම් කුමක් ද?
(1) මිරුගේන්දිරම් (2) කාරණාගමම්
(3) සර්වඥානෝත්තිරම් (4) පෞෂ්කර ආගමම්
(5) රෞරවාගමම්

21. වේද සාහිත්‍යයේ විස්තරාත්මක අදහස් ප්‍රකාශ කිරීම හේතුවෙන් පස්වන වේදය යනුවෙන් ප්‍රශංසා ලබන්නේ,
(1) අර්ථ සාත්තිරම් ය. (2) මහාභාරතය ය. (3) රඝුවම්සම් ය.
(4) බෘහත්සම්හිතයි ය. (5) මයමදම් ය.

22. දකුණු ඉන්දීය දේවාල ගෘහ නිර්මාණ කලා ඉතිහාසයේ වැඩි වශයෙන් දේවාල ගෝපුර ඉදිකරනු ලැබුවේ,
(1) පල්ලව යුගයේ ය. (2) චෝළ යුගයේ ය.
(3) සංග යුගයේ ය. (4) සංගමරුවිය යුගයේ ය.
(5) විජය නගර නායක්කර් යුගයේ ය.

[තුන්වැනි පිටුව බලන්න.

23. 'පත්තුමලයි කෝයිල්' නම් මුරුගන් දේවාලය පිහිටා ඇති රට කුමක් ද?
(1) කාම්බෝජය (2) සම්බා (3) ජාවා
(4) මැලේසියාව (5) තායිලන්තය

24. "ආර්ය සමාජීය සේවා ඉටු කිරීම තුළින් හින්දු ධර්මයේ ස්ව ආරක්ෂක සංකේතයක් ලෙස දයානන්ද සරස්වති සිටී" යනුවෙන් වර්ණනා කළේ,
(1) ඉන්දිරා ගාන්ධි ය. (2) ජවහර්ලාල් නේරු ය. (3) රාජාජි ය.
(4) සුවාමි විපුලානන්දර් ය. (5) වෛද්‍ය, එස්. රාධාක්‍රිෂ්ණන් ය.

25. සාම්ප්‍රදායික දෙවි පිළිම සාදන කැටයම් ශිල්පියකුට අත්‍යවශ්‍ය අංග දෙකක් වන්නේ,
(1) සරියයි හා කිරියයි ය. (2) සරියයි හා යෝගම් ය.
(3) කිරියයි හා භාවිතය ය. (4) සිත හා වචනය ය.
(5) භාවනා මන්ත්‍ර හා ශාස්ත්‍ර දැනුම ය.

26. ආත්මයේ විමුක්තියට අදාළ දර්ශනය පැහැදිලි කරන අයුරින් ශිව දෙවියන්ගේ දක්ෂිණාමූර්තයේ ඇතුළත් මුද්‍රාව,
(1) සූසි මුද්‍රාවයි. (2) කටක මුද්‍රාවයි. (3) සින් මුද්‍රාවයි. (4) වරද මුද්‍රාවයි. (5) අභය මුද්‍රාවයි.

27. ආත්මය නිවන ලැබීමට ශෛව සිද්ධාන්ත සම්ප්‍රදායේ සඳහන් අදියර තුන මොනවා ද?
(1) ඉරුවිනයියොප්පු, සංජිදම්, ප්‍රාරත්තම්
(2) සංජිදම්, ඉරුවිනයියොප්පු, සත්තිනිපාදම්
(3) ඉරුවිනයියොප්පු, මලපරිපාගම්, සත්තිනිපාදම්
(4) කර්මම්, භක්ති, මලපරිපාගම්
(5) භක්ති, ප්‍රාරත්තම්, ඉරුවිනෙයියොප්පු

28. 'ප්‍රභක්තියේ යොමු වීමෙන් විමුක්තිය අත්පත් වේ' යන ප්‍රතිපත්තිය තම දාර්ශනික සංකල්පය මගින් ඉදිරිපත් කළ දර්ශනවේදියා,
(1) සංකරර් ය. (2) රාමානුජර් ය. (3) ගෞඩපාදර් ය. (4) මත්තුවර් ය. (5) මෙයිකණ්ඩාර් ය.

29. වාර්ෂිකව ශෛව හා දෙමළ පර්යේෂණ සම්මේලන පවත්වා, ආගමික දැනුම වර්ධනය කරන අපරදිග ආගමික ආයතනය,
(1) ලන්ඩන් ශෛව මුන්නේට්‍ර සංගම් ය.
(2) ලන්ඩන් සිවයෝගම් හින්දු අරක්කට්ටලයි ය.
(3) ලන්ඩන් තිරුකෝයිල් එකමුතුව ය.
(4) කියුබෙක් ශෛව මහාසබයි ය.
(5) කැනඩා සිවතොණ්ඩන් මධ්‍යස්ථානය ය.

30. මඩකලපුව ශෛව පුලවර් කා. අරුණාසල තේසිගර්තුමා ශෛව ශිෂ්‍යයන්ට ලියූ ආගමික ග්‍රන්ථ ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) ශෛව සමය ආරම්භ පෝදිනි, ශෛව ඉලක්කිය කදා මංචරි, ශෛව සමය චින්තාමනි
(2) නීලකණ්ඩභාෂියම්, ඥානරත්නාවලි, ශෛව සමය චින්තාමනි
(3) වජ්රතන්ඩම්, ශෛව ඉලක්කිය කදාමංජරි, වීරපත්තිරාස්තිරම්
(4) සිවයෝගසාරම්, සිත්තාන්ද සිගාමනී, ශෛව සමය චින්තාමනි
(5) අඥාන විවේසනම්, නීලකණ්ඩභාෂියම්, ශෛව ඉලක්කිය කදාමංජරි

31. ශෛව සිද්ධාන්ත මාර්ගය පිළිපදින්නකු වශයෙන් තමන් ම, 'ශෛව සිද්ධාන්ත මාර්කන්' යන නමින් ප්‍රසිද්ධියට පත්කරගත් පල්ලව රජ,
(1) මහේන්ද්‍ර වර්මන් ය. (2) රාජසිම්මන් ය.
(3) පරමේස්වර වර්මන් ය. (4) මාමල්ලන් ය.
(5) සිම්ම වර්මන් ය.

32. හින්දු භක්තිකයන්ගේ ආර්ථික සංකල්පයේ යකඩ භාවිතය පිළිබඳවත්, එය කෘෂිකර්මයට බෙහෙවින් උපකාරී වූ බවත් සඳහන් කරන පැරණි ම ග්‍රන්ථය,
(1) සාන්දෝක්‍ය උපනිෂද් ය. (2) යජුර් වේදය ය. (3) සුක්‍රනීති ය.
(4) මානසාරම් ය. (5) බෘහත්සම්හිතයි ය.

33. "විනයින් නීංගි විලංගිය අරිවින් මුදල්වන් කන්ඩදු මුදනූලාගුම්" ලෙස ගීතිකා මාර්ගයෙන් ශෛව සිද්ධාන්ත අදහස් දෙමළ භාෂාවෙන් දක්වන ඉතා පැරණි ග්‍රන්ථය,
(1) සිලප්පදිකාරම් ය. (2) මනිමේගලයි ය.
(3) තොල්කාප්පියම් ය. (4) පරිපාඩල් ය.
(5) තිරුමුරුගාට්‍රුප්පඩයි ය.

34. ඉන්දීය වෛද්‍ය ක්ෂේත්‍රයේ පියා ලෙස සලකනු ලබන්නේ,
(1) භීෂ්මර් ය. (2) වසිට්ටර් ය. (3) වාල්මිකී ය. (4) තන්වන්දිරි ය. (5) වරාහමිහිරර් ය.

[ හතරවැනි පිටුව බලන්න.

35. හින්දූ ආගමික සම්ප්‍රදායේ භක්ති මාර්ගයට මූලාශ්‍රය වන ස්තෝත්‍ර සම්ප්‍රදායට මුලපිරූ පැරණි ම ග්‍රන්ථය,
(1) මනුස්මිරුදි ය. (2) මහාභාරතය ය. (3) ඍග් වේදය ය. (4) ප්‍රමාණංගල් ය. (5) සූක්‍තිනීති ය.

36. පහත සඳහන් ඒවායින් ශිව දෙවියන්ගේ තිරිපුරාන්දග මූර්තය, පිළිබඳ විස්තර හා සම්බන්ධ **නොවන්නේ** කුමක් ද?
(1) 'තිරිපුරම්' පිළිස්සූ වීර ක්‍රියාව සම්බන්ධ ඉතිහාසය සංග සාහිත්‍යවල සඳහන් වී ඇත.
(2) තාරගාට්සන්, කමලාට්සන්, විද්‍යුන්මාලි යන අසුරයන් තිදෙනකුගේ ආඩම්බරය පාලනය කර විනාශ කිරීම තිරිපුරාන්දගර්ගේ දේව ඉතිහාසයයි.
(3) පල්ලව හා පාණ්ඩ්‍ය රජවරුන්ගේ තඹ සන්නස් සහ සෙල්ලිපි මෙම මූර්තය පිළිබඳ ව සඳහන් කරයි.
(4) චෝළ යුගයේ තිරිපුරාන්දග මූර්තයට එතරම් ප්‍රසිද්ධියක් ලැබී තිබුණේ නැත.
(5) රජතුමා, යුද්ධයේ ජයග්‍රහණය සඳහා දිරිමත් කිරීමට මෙම මූර්තය හේතුවක් විය.

37. උතුරු ඉන්දීය භක්ති ව්‍යාපාරය සම්බන්ධයෙන් **නොගැළපෙන** අදහස කුමක් ද?
(1) උතුරු ඉන්දීය භක්ති ව්‍යාපාරයේ පුරෝගාමියා රාමානන්දර් වේ.
(2) රාමානන්දර් පන්ති භේදය හා ආගමික භේදය අතපසු කොට දමා, එකමුතුභාවය ඉදිරියට ගෙන ගියේ ය.
(3) කබීර්දාසර් රාමානන්දර්ගේ ගෝලයා විය.
(4) හින්දූ හා ඉස්ලාමීය එකමුතුභාවයට නිදසුනක් ලෙස කබීර්දාසර් ජීවත් වුණේ ය.
(5) ඉස්ලාමිකයකු ලෙස උපත ලැබූ කබීර්දාසර්, ශෛව භක්තිකයකු ලෙස ජීවත් වී, ශෛව හා ඉස්ලාමීය ආගම් අතර සම්බන්ධීකරණ පාලමක් ලෙස කටයුතු කළේ ය.

38. පහත සඳහන් ඒවායින් කුමාර දෙවියන්ගේ නාමයක් **නොවන්නේ**,
(1) කුහන් ය. (2) ගංගාදරන් ය. (3) කුමරන් ය. (4) කාංගේයන් ය. (5) ගුරුමූර්ති ය.

39. සුවාමි විපුලානන්දර් හා සම්බන්ධ **නොවන** ප්‍රකාශය කුමක් ද?
(1) බාල වයසේ දී ම හැකියා, දැනුම, බුද්ධිය වැනි ක්ෂේත්‍රවල ප්‍රවීණතාව ලැබ සිටි අයෙකි.
(2) 1924 වර්ෂයේ දී තීක්ෂා නාමයකින් පිදුම් ලැබූ අයෙකි.
(3) රාමක්‍රිෂ්ණ මිෂන් හා එක්ව කටයුතු කළ අයෙකි.
(4) නර්තනය, සංගීතය හා නාට්‍ය යන ක්ෂේත්‍රවල (මුත්තමිල්) ප්‍රවීණයෙකි.
(5) අධ්‍යාපනික සේවා හා කලා කටයුතුවලට තරම් කැමැත්තක් සමාජීය කටයුතුවලට නොදැක්වූවෙකි.

40. පත්තිනි දෙවියන්ගේ වන්දනාව හා සම්බන්ධ **නොවන** ග්‍රන්ථය,
(1) සෞන්දර්ය ලහරි ය. (2) සකලකලාවල්ලිමාලයි ය. (3) අභිරාමි අන්තාදි ය.
(4) මානසාරම් ය. (5) ශ්‍රී ලලිතා සහස්‍රනාමම් ය.

- පහත දී ඇති වචන අතුරෙන් **දෙකක්** විශේෂ කරුණක් මත එකිනෙක අතර සම්බන්ධතාවක් දක්වයි. එම සම්බන්ධතාව පදනම් කරගෙන අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** සලකුණු කරන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
| ඉතිහාසවල බලපෑම | යාගවේදි මැනුම් ප්‍රමාණය | පට්ටාරගුරු වන්දනාව | සම්පත් දියුණුව සඳහන් කරන පෞෂ්ටිකානි | ගුරුකුල සම්ප්‍රදාය |
| **F** | **G** | **H** | **I** | **J** |
| රජුගේ යහපතට අදාළ රාජකර්මානි | සුන්දරර්තුමන්ට රඳවා ආශිර්වාද කළ කතාව | උපනිෂද් | තිරුවාරූර්හි දී ලියවුණු එම දේවාලයේ ඉතිහාස කතාව | සුල්ව සූත්‍රය |

41. අග්නිදිග ආසියානු රටවල හින්දූ සංස්කෘතික සම්ප්‍රදාය සඳහන් කරන යුගලය කුමක් ද?
(1) A C (2) A E (3) A F (4) C D (5) C E

42. වෛදික සාහිත්‍යවල සඳහන් වන ගණිතය හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) B H (2) B I (3) B J (4) D J (5) E G

43. පැරණි හින්දූ අධ්‍යාපනික සම්ප්‍රදාය හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A E (2) A H (3) B H (4) C E (5) E H

44. අතර්වන් වේද මන්ත්‍ර හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A F (2) B D (3) C D (4) C E (5) D F

45. තමිල්නාඩු දේවාලවල දැකිය හැකි සුවිශේෂී සිතුවම් හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) B G (2) B I (3) C E (4) E I (5) G I

● අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව දී ඇති ප්‍රකාශ, **I, II, III, IV** යන තීරුවලට අනුව පිළිවෙළින් දැක්වෙන වරණය තෝරා, එහි **අංකය** සලකුණු කරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| A<br>උපවාස | F<br>රාජ්‍ය නීතිය | K<br>සිත්තාන්ද සිගාමනි | P<br>සතර වාර්ගික ආශ්‍රම වගකීම් |
| B<br>තනි පුද්ගල සමාජ විද්‍යාව පිළිබඳ නීතිරීති | G<br>මහණ ජීවිතය | L<br>තීර්ත්තම් | Q<br>තමිල්නාඩු වීර ශෛව සාම්ප්‍රදාය ස්ථාපිත කළ අයෙකි |
| C<br>ප්‍රදියට්ස ප්‍රමාණම් | H<br>තේවාරම්වල ප්‍රශංසා ලැබීම | M<br>ආප්තවාක්‍ය ප්‍රමාණම් | R<br>තවම් |
| D<br>තුරයිමංගලම් | I<br>වන්දනා ගමන් | N<br>නමසිවාය සම්බන්ධ විස්තරය | S<br>සත්තිනිපාදම් |
| E<br>ශිව දෙවියන්ගේ කාර්ය පහ හා සම්බන්ධ දෙයකි | J<br>අනුමාන ප්‍රමාණම් | O<br>ප්‍රායච්චිත්තම් | T<br>තිරුවාදිරයිවල විශේෂ වන්දනාව |

46. පුරාණම් විස්තර කරන ආගමික වන්දනා සම්ප්‍රදාය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AFLT (2) AILR (3) BGLS (4) BIOT (5) EFLP

47. ධර්ම ශාස්ත්‍ර ග්‍රන්ථවල සමාජ සංවර්ධනයට අදාළ ඒවා ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) AILT (2) BFOP (3) BGOR (4) CILR (5) EGLT

48. ශෛව සිද්ධාන්ත දාර්ශනික පැහැදිලි කිරීම්වලට උපකාරී වන වැදගත් අංග ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) BGLR (2) CHLR (3) CINR (4) CJMS (5) EGOR

49. සිවප්‍රකාස සුවාමිහල්ගේ ජීවිත තොරතුරු හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) AGLT (2) DGKQ (3) DHLT (4) DILR (5) DIOT

50. නඩරාජ පිළිමය හා සම්බන්ධ අංග ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) CILT (2) DILR (3) EHNT (4) EJLT (5) EGOT

* * *

0088

AL/2015/46/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. උතුරු ඉන්දියාවේ ගුප්ත යුගයේ හින්දු ශිෂ්ටාචාරය දියුණු වූ ආකාරය පහත සඳහන් ඒවායින් **දෙකක්** සම්බන්ධ ව පරීක්ෂා කරන්න.
   (අ) හින්දු ධර්මයේ වර්ධනය
   (ආ) සාහිත්‍ය සම්ප්‍රදාය
   (ඉ) කලා සම්ප්‍රදාය

2. තමිල්නාඩුවේ චෝළ යුගයේ ඇති වූ හින්දු ශිෂ්ටාචාර වර්ධනයේ ප්‍රධාන අංග පහත සඳහන් ඒවායින් **දෙකක්** සම්බන්ධ ව සාකච්ඡා කරන්න.
   (අ) රජවරුන්ගේ දායකත්වය හා සේවා
   (ආ) දේවාල හා ලලිත කලා වර්ධනය
   (ඉ) ශෛව හා ජෛන ආගම්

3. ශ්‍රී ලංකාවේ දහනවවැනි සියවසේ ඇති වූ හින්දු සංස්කෘතික වර්ධනය පහත සඳහන් මාතෘකා ඇසුරෙන් සාකච්ඡා කරන්න.
   (අ) ආගමික නායකයන්ගේ සේවා
   (ආ) ආගමික ආයතන

## II කොටස

4. සංකර වේදාන්තය දාර්ශනික සිද්ධාන්තයක් ලෙස බිහි වීම පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** සම්බන්ධ ව සාකච්ඡා කරන්න.
   (අ) සංකරර් පිළිගත් ප්‍රමාණ ග්‍රන්ථ
   (ආ) සංකර වේදාන්තයේ බ්‍රහ්ම
   (ඉ) විශ්වය පිළිබඳ සංකල්පය
   (ඊ) ආත්ම නිදහස සඳහා වන මාර්ග

5. පල්ලව යුගයේ ඇති වූ දේවාල ගෘහ නිර්මාණ වර්ධනය පහත සඳහන් ඒවා ඇසුරෙන් විස්තර කරන්න.
   (අ) රජවරුන්ගේ දායකත්වය
   (ආ) විවිධ දේවාල ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම

6. "බ්‍රහ්ම සමාජය නම් නූතන හින්දු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මඟින් හින්දු සමාජය ගොඩනැඟීමේ ප්‍රමුඛත්වයක් දැරුවේ රාජාරාම් මෝහන්රායි ය." මෙම ප්‍රකාශයේ සත්‍යතාව පිළිබඳ ව සාකච්ඡා කරන්න.

7. ශෛව සිද්ධාන්තය පැහැදිලි කරන දෙවි සංකල්පයේ ප්‍රධාන අංග පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පරීක්ෂා කරන්න.
   (අ) දෙවියන් සිටින බව තහවුරු කරන ක්‍රම
   (ආ) දෙවියන්ගේ ලක්ෂණ
   (ඉ) දෙවියන් සහ ආත්මය

8. පහත සඳහන් ඒවායින් **හතරකට** කෙටි සටහන් ලියන්න.
   (අ) සාග් වේදය
   (ආ) සිවඥානපෝදම්
   (ඉ) ලිංගෝද්භව මූර්තය
   (ඊ) නයිනතිව් නාගපූෂණි අම්මන් දේවාලය
   (උ) හින්දු වන්දනාවේ ඇතුළත් වෛද්‍ය ක්‍රම
   (ඌ) දෙමළ නීති ග්‍රන්ථවල සඳහන් වන ධාර්මික ගතිගුණ

More Past Papers at
tamilguru.lk

* * *